**ශීර්ෂය - 244 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය - 244 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 අප්‍රේල් 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 කාර්යසාධනය

#### 2.1.1 කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩ වෙළඳාම, සේවා වෙළඳාම, ආයෝජන හා රේගු සහයෝගීතාවය වැනි අනෙකුත් වෙළඳ අංශයන් ද ආවරණය වන පරිදි යෝජනා කරන ලද බහුපාර්ශවීය හා ද්වීපාර්ශවීය වෙළඳ ගිවිසුම් 4කට එළඹීම සඳහා අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා මට්ටමේ පැවතුණු නමුත්, 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 07 ක් ගතවී ඇතත්, අදාළ ගිවිසුම් සඳහා එළඹීම නිම වී නොතිබුණි. | යෝජිත බිම්ස්ටෙක් (BIMSTEC) ගිවිසුම ශ්‍රී ලංකාවද ඇතුළුව රටවල් 7 ක් ආවරණය වන බහුපාර්ශවීය ගිවිසුමකි.<br><br>මෙම දෙපාර්තමේන්තුවට අදාළ වන්නේ වාණිජ දෙපාර්තමේන්තුව සමඟ එක් වී වෙළඳ හා ආයෝජන අංශයට අදාළව ගිවිසුමේ සාමාජික රටවල එකඟත්වයෙන් තීරු බදු ලිහිල්කරණ වැඩසටහන (Trade Liberalization Programme) සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම යි.<br><br>ඒ අනුව, ශ්‍රී ලංකා පාර්ශවයෙන් තීරු බදු ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ ක්‍රියාවලියට අදාළව සියලු කටයුතු මෙම දෙපාර්තමේන්තුව විසින් අවසන් කර වාණිජ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අවසන් වුවද, මෙය රටවල් හතක් අතර ක්ෂේත්‍ර කිහිපයක් ආවරණය වන පරිදි යෝජනා කර ඇති බහු ආංශික ගිවිසුමක් වන බැවින් සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වය හා එකඟතාවය නොමැතිව මෙම ගිවිසුම ඒක පාර්ශවික වශයෙන් අවසන් කිරීමේ හැකියාවක් නොමැත. | ප්‍රමාදයන්ගෙන් තොරව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | ආර්ථික සහයෝගීතාවය සඳහා වූ (ETCA) ගිවිසුම 2015 වර්ෂයේදී ආරම්භ වූ අතර එහි පළමු සාකච්ඡා වටය 2016 අගෝස්තු මස පවත්වන ලදී. දැනට සාකච්ඡා වට 11 ක් මෙම ගිවිසුම හා සම්බන්ධව පවත්වා ඇත.<br><br>යෝජිත චීන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA) චීනය හා ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශ්වික ගිවිසුමක් වන බැවින් දෙපාර්ශවයේම සහභාගීත්වය හා එකඟත්වය නොමැතිව මෙම ගිවිසුම ඒක පාර්ශවික වශයෙන් අවසන් කිරීමේ හැකියාවක් නොමැත.<br><br>යෝජිත ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමේ සාකච්ඡා මූලික අදියරේ පවතින අතර දෙපාර්ශවයම එකඟතාවයට පැමිණීමෙන් අනතුරුව පමණක් ගිවිසුමට එළඹිය හැකිය. | |
| **(ආ) කාර්යසාධන දර්ශක** | | |
| වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් අපනයන සඳහා තීරුබදු මාර්ගෝපදේශ නිකුත් කිරිම යටතේ අභ්‍යන්තර කටයුතුවලදි භාවිතා කිරීම සඳහා පිළියෙල කර ගැනිමට යෝජිත දත්ත ගොනුව (data sheet) පිළිබඳ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණි. | 2022 වර්ෂයේදී මෙම කටයුත්ත හා සම්බන්ධ මූලික කටයුතු සිදු කර තිබූ අතර 2023 වර්ෂයේදී කාර්යයන් අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | සැලසුම්වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| **(ඇ) ක්‍රියාකාරී සැලැස්මේ භෞතික ප්‍රගතිය** | | |
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන්/ ප්‍රතිපත්තීන් 10ක් හා ඊට අදාළ නිමවුම් සහ දර්ශක 18 ක් සම්බන්ධ සැලසුම්ගත පරිදි භෞතික ප්‍රගතියක් ලබා නොතිබුණ බව නිරීක්ෂණය විය. | ඔබ විසින් නිරීක්ෂණය කර තිබූ කාර්යයන්/ ප්‍රතිපත්ති කිහිපයක output/ indicator සම්බන්ධයෙන් භෞතික ප්‍රගතියක් සමාලෝචිත වර්ෂය තුල දක්වා නොමැති අවස්ථා කිහිපයක් ඇති බවට එකඟවෙමි.<br><br>යම් යම් වර්ෂවලදී දක්වා ඇති output/indicator ආදිය සියයට 100 ක් අපේක්ෂිත පරිදි ඉටු නොවන අවස්ථා පවතින බව කාරුණිකව දන්වමි. | සැලසුම්වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

## 3. මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 64 ක් වූ අතර, ඉන් තනතුරු 08 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු තනතුරු අතර, තෘතියික මටට්ටමේ තනතුරු 02 ක් ද, ද්විතීක මට්ටමේ තනතුරු 03 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක් ද විය. | ඒකාබද්ධ සේවයට අදාළව 2022 වර්ෂයේ පැවැති පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර, නව බඳවාගැනීම් සිදු නොවීම මත පුරප්පාඩු පිරවීම ප්‍රමාද වූ බව කාරුණිකව දන්වමි. | විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලයේ සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. |